(50)

11/3-1
NCP/CS/ED/05/02/05/චක්‍රලේඛ

2024.02. 09

ප්‍රධාන ලේකම් චක්‍රලේඛ 2022/02(iii)

උතුරු මැද පළාත්
සියළුම ලේකම්වරුන් / නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන් හා,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්.

**<u>විදේශ නිවාඩු ඉල්ලුම්පත් නිර්දේශ කිරීම.</u>**

ආයතන සංග්‍රහයේ XII වැනි පරිච්ඡේදයේ 1:4 උප වගන්තිය අනුව යම් රජයේ නිලධාරියකු මෙරටින් බැහැරව ගත කරන නිවාඩු අයදුම් පත්‍රය හැකි සෑම විටම මාස තුනකට අඩු නොවන කාල සීමාවකට පෙර නිවාඩු අනුමත කරන බලධාරියා වෙත ඉදිරිපත් කල යුතු බව සඳහන් කර ඇතත් නිසි ආකාරයට එසේ සිදු නොවන බව නිරීක්ෂණය වේ.

02.නොවැලැක්විය හැකි හේතුවක් මත හදිසි විදේශ ගමන් යෙදෙන අවස්ථාවකදී වුවද අවම වශයෙන් විදේශ ගතවීමට පෙර නිවාඩු ඉල්ලුම්පත්‍රය අනුමැතිය සඳහා ඉදිරිපත් කල යුතුය.

03. එහෙත් පසුගිය කාල සීමාව තුල මෙලෙස අනුමැතිය සඳහා ඉදිරිපත් කරනු ලබන විදේශ නිවාඩු ඉල්ලුම්පත්‍ර බොහෝ ප්‍රමාද වී මෙම කාර්යාලය වෙත ඉදිරිපත් වන බව නිරීක්ෂණය වන අතර කෙටි කාලීන විදේශ නිවාඩු අයදුම්පත්‍ර සමහර නිලධාරින් විදේශ ගත වී නැවත දිවයිනට පැමිණීමෙන් පසුව අනුමැතියට ඉදිරිපත් වන අවස්ථා ද වේ.

04. මෙය ඉතා අසතුටුදායක තත්වයක් වන බැවින් ඉදිරියේදී මෙවැනි තත්වයක් ඇති නොවන පරිදි කටයුතු කරන ලෙස වගකිව යුතු නිලධාරින් දැනුවත් කරන ලෙස කාරුණිකව දන්වන අතර, නොවැලැක්විය හැකි හේතුවක් මත ප්‍රමාද වී ඉදිරිපත් වන අයදුම්පත්‍ර හැර, අනෙකුත් සියළු විදේශ ගමන් සඳහා විදේශ නිවාඩු අයදුම්පත්‍ර අනුමැතිය සඳහා මා වෙත නොපමාව යොමුකල යුතු බව කාරුණිකව දන්වමි.

05. එසේම විදේශ නිවාඩු සඳහා වන අයදුම්පත්‍ර දෙපාර්තමේන්තු ප්‍රධානියා හා ලේකම්වරයා විසින් සිය නිර්දේශය සටහන් කර පෞද්ගලිකවම අත්සන් කල යුතු වේ.

ආර්.එම්.ඩබ්.එස්.සමරදිවාකර,
ප්‍රධාන ලේකම්,
උතුරු මැද පළාත

0/c